PRIMARK

## අපට කියන්න

**ඔබට රැකියා ස්ථානයේදී ගැටළුවක් ඇත්නම් අපගේ නොමිලේ TELL US ක්ෂණික ඇමතුම් අංකය, වෙබ් අඩවිය හෝ යෙදුම භාවිතයෙන් Primark සම්බන්ධ කරගත හැකිය, Primark ඔබේ ගැටළුවලට නිර්නාමිකව සහ රහස්‍ය ලෙස සවන් දීමට සූදානම්ව සිටී.**

### TELL US භාවිත කළ හැක්කේ කාටද

ඕනෑම කෙනෙකුට Tell Us ක්ෂණික දුරකථන අංකය, වෙබ් අඩවිය හෝ යෙදුම භාවිතා කරමින් Primark සම්බන්ධ කර ගත හැකිය. උදාහරණයක් ලෙස- පූර්ණ කාලීන, අර්ධකාලීන හෝ නිත්‍ය, තාවකාලික සේවකයින් හෝ නියෝජිත සේවකයින්, ගෘහස්ථ සහායකයින්, නියෝජිත සේවකයින්, සීමාවාසික පුහුණුකරුවන්, ස්වේච්ඡා සේවකයින්, නිෂ්පාදන කාර්ය මණ්ඩලය හෝ මුළුතැන්ගෙයි කාර්ය මණ්ඩලය

### ඔබට TELL US හරහා පැවසිය හැක්කේ කුමක්ද

ඔබ හෝ ඔබේ සගයන් රැකියා ස්ථානයේ නුසුදුසු ලෙස හෝ අසාධාරණ ලෙස සලකනු ලැබේ යැයි ඔබ විශ්වාස කරන්නේ නම්, නැතිනම් මානව හිමිකම්, සදාචාරාත්මක ගැටළු සහ පරිසරය සම්බන්ධයෙන් Primark හි ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම් ද ඇතුළුව රැකියා ස්ථානයේ දී වංක, නීති විරෝධී හෝ භයානක හැසිරීම් ඔබ දකින්නේ නම් ඔබට TELL US හරහා ඒ බව පැවසිය හැකිය.

නිදසුනක් ලෙස, ඔබේ සේවා ස්ථානය ආරක්ෂිත නොවන බව ඔබට හැඟේ, ඔබ වාචික හෝ ශාරීරික අපයෝජනයන්ට මුහුණ දී ඇත, නැතිනම් ඔබේ වැටුප් නිසි පරිදි ගෙවා නැත, යනාදි ලෙස...

**හදිසි අවස්ථාවක දී කරුණාකර ප්‍රාදේශීය හදිසි සේවාව අමතන්න:** [119]

Tell Us විසින් (පැමිණිලි යාන්ත්‍රණ හෝ කිසියම් වෘත්තීය සමිති හෝ කම්කරු කමිටු ක්‍රියාවලියක් වැනි, පවතින අවස්ථාවලදී) ඔබේ සාමාන්‍ය සේවා ස්ථාන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ප්‍රතිස්ථාපනය නොකරන බව කරුණාවෙන් සලකන්න ඒ වගේම ඔබට හැකි යැයි හැඟෙන්නේ නම් ඔබේ කළමනාකරු, අධීක්ෂක හෝ සේවක කමිටුව සමඟ ඔබේ ගැටළුව මතු කරන ලෙස අපි යෝජනා කරමු.

### ඔබේ අනන්‍යතාව

TELL US හරහා ඔබ අප සමඟ ගැටලුවක් බෙදාගන්නේ නම් අපි ඔබේ අනන්‍යතාවය රහස්‍ය ලෙස තබා ගන්නා අතරම ඔබේ පැමිණිල්ලෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක වළක්වන්නෙමු.

### TELL US හරහා කියන්නේ කෙසේද

ක්ෂණික ඇමතුම් අංකය භාවිතයෙන්, වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ යෙදුම ඔබේ දුරකථනයට බාගැනීමෙන් ඔබට TELL US හරහා අපට පැවසිය හැකිය. විස්තර මෙතනින්:

| **අපගේ ක්ෂණික දුරකථන අංකයට ඇමතීමෙන්:** | **පහත සඳහන් වෙබ් ලිපිනය හරහා:** | **පහත QR කේතය භාවිතා කරමින් යෙදුම බාගත කිරීමෙන්:** |
|---|---|---|
| ප්‍රාදේශීය නොමිලේ දුරකථන අංකය TELL US ප්‍රතිපත්ති සහ පෝස්ටර් හි ලද හැකිය | https://primark.speakup.report/tellus | |
| **යොමු කරන විට, පහත සඳහන් පිවිසුම් කේතය ඇතුළත් කරන්න: 106502** | | |
| ඔබේ ගැටළුව පිළිබඳව විස්තර කරමින් ඔබේ ස්වදේශීය භාෂාවෙන් හඬ පණිවිඩයක් පටිගත කරන්න, නැතහොත් පණිවිඩයක් ලියන්න | | |
| එවිට ඔබට අනන්‍ය සිද්ධි අංකයක් ලැබෙනු ඇත; ඕනෑම අමතර තොරතුරක් හෝ පසු විපරම් කිරීමක් සඳහා මෙය අවශ්‍ය වේ | | |
| පැය 72 ක් ඇතුළත ඔබට තහවුරු කිරීමක් ලැබෙනු ඇති අතර පසුව Primark මේ පිළිබඳව විමර්ශනය කරනු ඇත | | |

**මෙම සිද්ධිය පිළිබඳ ප්‍රතිඵලය Tell Us පද්ධතිය තුළ බෙදා ගනු ඇති බැවින් ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා නිතිපතා නැවත පිවිසීමට මතක තබා ගන්න.**

*අපි ඔබ ගැන සැලකිලිමත් වන අතර,*
*ඔබේ ගැටළු පිළිබඳව ද අපි සැලකිලිමත් වෙමු.*